පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

**විෂය - විද්‍යාව**

**සතිය - මාර්තු-I**

**ශ්‍රේණිය - 10**

**සැකසුම - A.W.R.S. ප්‍රේමරත්න මිය, කෑ/දෙහි/ගනේපල්ල ක.වි.**

## සර්ෂණය

පාඩම හොඳින් අධ්‍යනය කර පහත බහුවරණ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) අප ඉතා සුළු බලයක් යොදා මේසයක් තල්ලු කිරීමට උත්සහ කළහොත් එය චලනය <u>නොවන්නේ,</u>

1) මේසය මගින් පොළව මතට අප යෙදූ බලයට සමාන බලයක් යොදන බැවිනි.
2) පොළව මගින් මේසය මතට අපයෙදූ බලයට සමාන බලයක් යොදන බැවිනි.
3) මේසය බරෙන් ඉතා වැඩි බැවිනි.
4) අප බලය යෙදූ දිශාව වැරදි බැවිනි.

(2) මේසය සුළු බලයක් මගින් චලනය නොවී පවතින විටදී පොළවෙන් හා අප විසින් එයට යොදන බල එකිනෙකට,

1) සමාන වේ. 2) ප්‍රතිවිරුද්ධ වේ. 3) සංතුලනය වේ. 4) ඉහත කරුණු සියල්ලම සිදු වේ.

(3) ඉහත සඳහන් මේසය මතට පෙරට වඩා වැඩි බලයක් පෘෂ්ඨයට සමාන්තරව යෙදුවත් මේසය චලනය <u>නොවන්නේ,</u>

1) බලය නිවැරදි දිශාවට යොදා නැති නිසා.
2) මේසය මතට යොදන බල අසංතුලිත නිසාය.
3) අප යෙදූ බලයට වඩා සර්ෂණ බලය අඩු නිසාය.
4) අප යෙදූ බලය සංතුලනය කිරීමට ප්‍රමාණවත් සේ සර්ෂණය බලය ඉබේම වැඩි වූ නිසාය .

(4) වස්තුවක් චලනය කිරීමට යොදන බාහිර බලය සංතුලනය කරමින් සර්ෂණ බලය ඉබේම සකස්විය හැක්කේ,

1) ඕනෑම අගයක් දක්වාය. 2) එක්තරා සීමාවක් දක්වා පමණි.

(5) ඉහත සඳහන් මේසය චලනය වන අවස්ථාවේදී අප විසින් යෙදූ බලය හා සර්ෂණ බලය සැසඳුවහොත්,

1) සර්ෂණ බලය ඉබේ සකස්විය හැකි සීමාව පසුකර ඇත.
2) අප යෙදූ බලය සර්ෂණ බලයට වඩා අඩු වී ඇත.
3) සර්ෂණ බලය නැතිවී ඇත.
4) එම බල එකිනෙකට සමාන වී ඇත.

(6) සැම විටම සර්ෂණ බල ක්‍රියාත්මක වන්නේ,

1) ආසන්නයේය. 2) අභ්‍යන්තරයේය. 3) බාහිර පෘෂ්ඨ අතරය. 4) ස්පර්ශ පෘෂ්ට අතරය.

(7) සර්ෂණ බල ක්‍රියාත්මක වන අවස්ථා වන්නේ,

1) වස්තුවක් නිශ්චලව ඇති විටය. 2) චලනය වන වස්තූන් මත පමණි.
3) වස්තුවක් ඒකාකාර ප්‍රවේගයකින් චලනය වන විට පමණි. 4) වස්තුවක සාපේක්ෂ චලිතයක් හෝ චලිතයට පෙළඹීමක් ඇති විටය.

(8) වස්තුවක් චලනය වීම සඳහා පෙළඹීමක් ඇතිවිට යෙදෙන සර්ෂණය වන්නේ,

1) ගතික සර්ෂණ බලය. 2) සීමාකාරී සර්ෂණ බලය. 3) ස්ථිතික සර්ෂණ බලය.

(9) වස්තුවක් චලනය වීම ඇරඹුණු විට යෙදෙන්නේ,

1) ගතික සර්ෂණ බලය. 2) සීමාකාරී සර්ෂණ බලය. 3) ස්ථිතික සර්ෂණ බලය.

(10) ස්පර්ශව පවතිනා වස්තු 2 ක ස්පර්ෂ පෘෂ්ඨ අතර ඇති වන උපරිම ඝර්ෂණ බලය එම පෘෂ්ඨ අතර,

1) ගතික ඝර්ෂණ බලයයි. 2) සීමාකාරී ඝර්ෂණ බලයයි. 3) ස්ථිතික ඝර්ෂණ බලයයි.

(11) ගතික ඝර්ෂණ බලය, සීමාකාරී ඝර්ෂණ බලයට,

1) සමානය. 2) ඉතා වැඩිය. 3) සුළු වශයෙන් අඩුය. 4) සුළු වශයෙන් වැඩිය.

පෙළපොතේ 100 පිටුව - ක්‍රියාකාරකම 2 අධ්‍යනය කර 12 හා 13 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

(12) රළුබව අඩුම සිට වැඩිම දක්වා වැලි කඩදාසි යොදාගෙන ක්‍රියාකාරකම සිදුකල විට සීමාකාරී ඝර්ෂණය,

1) එකම අගයක් ගනී. 2) ක්‍රමයෙන් වැඩිවේ. 3) ක්‍රමයෙන් අඩුවේ. 4) ඒකාකාරව අඩුවේ. .

(13) මෙම ක්‍රියාකාරකමෙන් පැහැදිලි වන්නේ, ඝර්ෂණය කෙරෙහි ස්පර්ශ පෘෂ්ඨ වල,

1) පරිමාව බලපාන බවයි. 2) ස්වභාවය බලපාන බවයි.
3) වර්ගඵලය බලපාන බවයි. 4) බලපෑමක් නොමැති බවයි.

ප්‍රශ්න අංක 14 හා 15 ට, 101 පිටුවේ ක්‍රියාකාරකම 3 පාදක කරගන්න.

(14) මෙම ක්‍රියාකාරකමේදී යොදාගන්නා ලද ලී කුට්ටියේ,

1) පෘෂ්ඨ වල වර්ගඵල පමණක් වෙනස්ය. 2) පෘෂ්ඨ වල මතුපිට ස්වභාවය පමණක් වෙනස්ය.
3) පෘෂ්ඨ වල වර්ගඵල වෙනස් නොවේ. 4) පෘෂ්ඨවල වර්ණය වෙනස් විය යුතුය.

(15) ක්‍රියාකාරකමේ ප්‍රතිඵල අනුව සීමාකාරී ඝර්ෂණය කෙරෙහි ස්පර්ශ පෘෂ්ඨවල,

1) වර්ගඵලය බලනොපායි . 2) වර්ගඵලය බලපායි.
3) ස්වභාවය බලනොපායි. 4) ස්වභාවය බලපායි.

102 පිටුව ක්‍රියාකාරකම 4 ඇසුරින් 16 හා 17 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(16) ලී කුට්ටි ගණන වැඩිකිරීමේදී සිදුවන්නේ,

1) වස්තුවේ බර වැඩිවීම. 2) වස්තුවේ බර පහළට ක්‍රියා කිරීම.
3) මේසයේ පෘෂ්ඨයෙන් වස්තුව මත එහි බරට සමාන බලයක් ඉහළට යෙදීම. 4) ඉහත කරුණු සියල්ලම

(17) වස්තුවේ බරට සමානව මේසයේ පෘෂ්ඨයෙන් ලී කුට්ටිය මත ඉහළට ක්‍රියා කරන්නේ,

1) අභිලම්බ ප්‍රතික්‍රියාවයි. 2) ඝර්ෂණ බලයයි. 3) බරයි. 4) ස්කන්ධයයි.

(18) පෘෂ්ඨ 2 ක් අතර අභිලම්බ ප්‍රතික්‍රියාව වැඩිවන විට සීමාකාරී ඝර්ෂණ බලය,

1) අඩුවේ. 2) වැඩිවේ. 3) වෙනස්නොවේ. 4) කිව නොහැක.

(19) යන්ත්‍ර හා උපකරණ ක්‍රියාත්මක වන විට ඒවායේ කොටස් එකිනෙක ගැටීමෙන් ක්‍රියාත්මක වන ඝර්ෂණ බලය නිසා,

1) එම බලවලට එරෙහිවද කාර්යය කිරීමට සිදුවේ. 2) බොහෝ ශක්තිය වැයවී ශක්තිය අපතේ යයි.
3) උෂ්ණත්වය වැඩිවෙයි. 4) ඉහත කරුණු සියල්ලම සිදුවේ.

(20) ස්පර්ශ පෘෂ්ඨ වල රළු බව අඩුකර ගැනීමට භාවිත කර ඇති උපක්‍රමය කුමක්ද?

1) කැරම් ගැසීමේදී ලෑල්ල මතුපිටට පුයර දැමීම.
2) පඩිපෙල රළුවට සැකසීම.
3) ටයර් වල කට්ටා කැපීම.
4) සෙරෙප්පු වල අඩියේ කට්ටා කැපීම.